**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමාන්‍ය පාඩම් - 8 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 7.3.1. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නිර්මාණ අගයමු |

ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මෙසපොටේමියානු, මිසර වැනි පූර්ව ඓතිහාසික උසස් ශිෂ්ටාචාර හා සම තත්ත්වයේ ලා සැලකිය හැකි ය. පුරා විද්‍යාඥ ශ්‍රීමත් ජෝන් මාෂල්ගේ විශ්වාසය වූයේ මෙම ශිෂ්ටාචාරය ක්‍රි.පූ. 3250 - 2750 අතර කාල වකවානුවට අයත් බව ය. එම ශිෂ්ටාචාරයේ ස්වර්ණමය කාලය ක්‍රි.පූ. 2500 - 1500 අතර වශයෙන් ඉන්දියානු පුරා විද්‍යාඥයින් විසින් දක්වයි. මෙම ශිෂ්ටාචාරය මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාර වශයෙන් ද හඳුන්වනු ලබයි. මෙහිදී හමුවූ මූර්ති ලෙස පූජක රුව, නලගන රුව, රතු වැලි ගලින් කළ කවන්ධ මිනිස් රුව ගත හැකිය.

## පූජක රුව

- මෙය සොයාගෙන ඇත්තේ මොහෙන්ජොදාරෝ නගරයෙනි. මෙයින් පුරුෂයකුගේ උඩුකය දැක්වේ.
- ජීවමාන කෙනෙකු නිරූපණය කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙනේ.
- සෙ.මී. 19 ක් උස ය. සුදු හුණු ගලින් නිමවා ඇත.
- මෙයින් පූජකවරයකු නිරූපණය වන බව සාමාන්‍ය පිළිගැනීමයි.
- ඒකාංශ කරන ලද සළුව, අඩවන් දෙනෙත් හා හිස අඩක් මුඩු කොට තිබීම මෙම රූපය භාවනානුයෝගී පූජක රුවක් ලෙස හැඳින්වීමට හේතු වී ඇත.
- ඒකාංශ කරන ලද සළුවෙහි පෙති තුනක මලක හෝ කොළයක හැඩය ගත් රටාවකින් සරසා ඇත.
- නළල මත ගාංචුව සහිත නලල් පටියකි.

### **ක්‍රියාකාරකම**

පහත මූර්තිය හඳුනාගනිමින් කෙටි හැඳින්වීමක් කරන්න

- හඳුනාගත් බව : ...............................
- යුගය : ...............................
- කාලය : ...............................
- මාධ්‍ය : ..................
- ශිල්ප ක්‍රමය : ..................
- කලාත්මක ලක්ෂණ: ..................



### **ඇගයීම**

පහත දක්වා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

01) ඉන්දු නිම්නයෙන් හමුවූ මූර්ති හා කැටයම් නම් කරන්න

02) ඉන්දු නිම්න කලා නිර්මාණවල ඓතිහාසික පසුබිම පිළිබඳ විස්තර කරන්න

03) මෙහි නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ මාධ්‍ය හා ශිල්ප ක්‍රම විස්තර කරන්න

04) ඉන්දු නිම්න කලා නිර්මාණවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරන්න